# උඩපළාත ප්‍රාදේශීය සභාව
# 2022.06.21 දින ටෙන්ඩර් මණ්ඩල වාතර්ාව

- **තීරණ අංක 01**

උඩපළාත ප්‍රාදේශීය සභා කායර්ාලයේ සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍යම භාණ්ඩ කිහිපයක් මිලදී ගැනීමට අවශ්‍ය බැවින් මෙම දිනට ටෙන්ඩර් මණ්ඩලයක් පැවැත්වීමට කටයුතු කෙරුණි. ඒ අනුව, මාගර් කම්කරුවන්ට අවශ්‍ය තණකොළ කැපීමේ යන්ත්‍රයක් මිලට ගැනීමට මිල කැඳවීය. (සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්) නමුත් ලැබී තිබුයේ එක් මිල ගණනකි.

| අනු අං: | විස්තරය | උපුල් හාඩ්වෙයාර් |
|---|---|---|
| 01 | 1**hp** ප්‍රමාණයේ **4 Strock** තණකොළ කැපීමේ යන්ත්‍රය ( වසර 02ක වගකීමක් ඇති) | රු.54200.00<br>Jaint Brand (4 Storke)<br>6 mnt War. 1HP – (5days validity) |

මේ සම්බන්ධව පෙර අවස්ථාවෙහිදී කැඳවූ මිල ගණන් අනුව 4-Stroke නොව 2-Stroke යන්ත්‍ර පමණක් ඇති බව අවසානයේ දැන්වූයෙන් එම මිලදී ගැනීම නොකළ අතර මෙවර මිල කැඳවීම් ද ලැබී ඇත්තේ එකක් පමණි. එහිද සඳහන් වන්නේ දින 5ක් තුල පමණක් වලංගු මිල ගණනක් වන බවය.

එබැවින් මෙම මිලට භාණ්ඩය හදිසියේ මිලදී ගැනීමට පෙර තවත් ප්‍රදේශයේ යම් සැපයුම්කරුවන් එකක් හෝ ඊට වැඩි ගණනකින් හෝ මිල ගණන් ලබා ගෙන දෙකම සසඳා එම මිල ගණන් අනුව සුදුසු තණකොළ කැපීමේ යන්ත්‍රයක් මිලට ගැනීම උචිත වන බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. (එක් ආයතනයකින් පමණක් මිල ලැබී තිබීමෙන් වත්මන් වෙළඳපොළ මිල ගණන් කෙසේ වේද යන්න තීරණයක් ගැනීමට හෝ අදහසක් ලබා ගැනීමට අපහසු බැවින් මෙසේ තීරණය කරන ලදි.)

- **තීරණ අංක 02**

පුස්තකාල තරග සඳහා සහ ඊ-නැණ පියස සඳහා අවශ්‍ය සහතික මිලදී ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ ප්‍රදේශයේ එම කායර්යන් සම්බන්ධ ප්‍රසිද්ධ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීය.

| අනු අං: | විස්තරය | **KC** ක්‍රියේෂන්ස් | තිළිණ ප්‍රින්ටසර් | |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල තරග සඳහා - 446 | 18500.00 | 18350.00 | 14750.00 |
| 02 | ඊ-නැණ පියස සඳහා - 60 | | | 3600.00 |

මෙම මිල ගණන් අනුව තිළිණ ප්‍රින්ටසර් ආයතනයෙන් අදාල සහතිකපත්‍ර මුද්‍රණය කර ගැනීම සුදුසු බවට තීරණය වූ අතර ඒ අනුව, පුස්තකාල තරග සඳහා සහතිකපත් 446ක් සඳහා රු.14750.00ට ත්, ඊ නැණ පියසට සහතික 60ක් (එකක් රු.60 බැගින්) රු.3600.00 ටත් අවම මිල ගණන් යටතේ මුද්‍රණය කර ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය විය.

- **තීරණ අංක 03**

පුස්තකාල තරග සඳහා ත්‍යාගයන් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය.ඒ සඳහා සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් මෙන්ම ප්‍රදේශයේ ප්‍රසිද්ධ සැපයුම්කරුවන් තෝරාගන්නා ලදි. පහත එම මිල ගණන් දැක්වේ.

| අ අං | විස්තරය | LH චන්ද්‍රසේකර | ජේපලර්යින් |
|---|---|---|---|
| 01 | කවකටු පෙට්ටි | Natraj 320.58 | Rexon 320.58 |
| 02 | පොත් - පිටු 120 | 49.42 | 49.42 |

| | | | |
|---|---|---|---|
| 03 | නිල් පෑන් | 21.84 | 21.84 |
| 04 | ළමා කුඩ | --- | --- |
| 05 | සාමාන්‍ය කුඩ | --- | --- |

(7 days valid / Cheque with order) (21 days valid)

එම මිල ගණන් අනුව, අවම මිල යටතේ සහ දින 21ක් ගෙවීම් සඳහා කාලය ලැබී තිබූ ජේපලර්යින් ආයතනයෙන් කවකටු පෙට්ටි 01ක් රු. 252.00 ට ත්, පොත් - පිටු 120 10ක් රු.386.40 වත්, නිල් පෑන් 01ක් රු.19.04 වත් මිලට ගැනීම සුදුසු බවටත්, කුඩ වගර් සඳහා මිල ගණන් ලැබී නොතිබීම හේතුවෙන් ප්‍රදේශයේ ම ඇති දේශීය නිශ්පාදිත ආයතනයක් වන කඳුරට කුඩ ආයතනයෙන් විමසා සාධාරණ මිලකට කුඩ ලබා ගැනීම සුදුසු බවටත් ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 04**

අත්‍යාවශ්‍ය වූ විට මාගර්ගත ක්‍රමය ඔස්සේ පුහුණු වැඩසටහන් / රැස්වීම් ආදිය හා කායර්ාල කටයුතු පහසුකර ගැනීමට දෙවන වරට ද ලැප්ටොප් පරිගණකයක් මිලට ගැනීමට මිල ගණන් කැඳවීය. (සභාවේ සහ පළාත් සැපයුම්කරුවන්)

| අනු අං | විස්තරය | ජේපලර්යින් | ජෝන් කීල්ස් (JKOA) | Base HP | Gestetner |
|---|---|---|---|---|---|
| 01 | ලැප්ටොප් පරිගණක යන්ත්‍රය (Laptop Computer) | 227000.00 Dell Vostro 3510 (3yrs) | 285000.00 Asus (3yrs) | 295000.00 HP (3yrs) | නැත |

මෙවර මිල ගණන් කිහිපයක් ලැබී ඇති බැවින් ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු මහතා ලවා පිවර්තර පරීක්ෂා කර සුදුසුම ලැප්ටොප් පරිගණකය යන්ත්‍රය මිලට ගැනිම සුදුස බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 05**

වාරියගල සහ ග්‍රෝව්හිල් පුස්තකාලවල ආරම්භ කර ඇති මැහුම් පාඨමාලා සඳහා අවශ්‍ය මහන මැෂිමක් මිලට ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හා ප්‍රදේශයේ ප්‍රසිද්ධ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන ලදි.

| අනු අං | විස්තරය | Dinapala | Singer PLC |
|---|---|---|---|
| 01 | මේසය මත තබා ක්‍රියාත්මක කල හැකි මහන මැෂිම | USHA 80640.00 | Singer 58899.05 |

ඊට ලද මිල ගණන් අනුව අවම මිල හා වසරක වගකීම් කාලයක් ද ඇති බැවින් මෙන්ම සිංගර් වගර්ය (Brand) හොද එකක් බැවින් එම මහන මැෂිමක් රු.58899.05 ට සිංගර් ආයතනයෙන් මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

## තීරණ අංක 06

කායර්ාලය සඳහා අත්‍යාවශ්‍යා ලිපි ද්‍රව්‍ය මිලට ගැනීමට මිල ගණන් කැඳවූ අතර ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | සෙන්ට්‍රල් ස්ටේෂනරිස් | එල්.එච්. චන්ද්‍රසේකර | ජේපලර්යින් | නිව් ජෙනරල් |
|---|---|---|---|---|---|
| 01 | ටිපෙක්ස් | 60.00 | Atlas 75.82 | Primium 89.60 | 132.00 |
| 02 | ජේපර් ක්ලිප්ස් | 65.00 | 50.54 | 78.40 | 97.00 |
| 03 | අඩි රූල් (දිග) | 25.00 | Natraj 15.28 | Natraj 39.20 | 37.00 |
| 04 | ජේපර් කටර් | 30.00 | Large 158.08 | Large 106.40<br>252.00 | 44.01 |
| 05 | බොක්ස් ෆයිල්ස් 2'' -<br>3'' - | 475.00<br>475.00 | 556.40<br>572.00 | ---<br>672.00 | 515.00<br>455.00 |
| 06 | හයිලයිට් පෑන් | 75.00 | Atlas 89.29 | 78.40 | 95.00 |
| 07 | දෙපියන් ෆයිල් කවර (හාඩ් ෆයිල්) | 75.00 | Edmand 105.30 | 420.00<br>162.40 | 185.00 |
| 08 | පැන්සල් | Atlas 30.00 | 26.00 | Azmo 16.80 | 17.00 |
| 09 | 85 A Hp Laserjet Toner | 17500.00<br>3900.00 | 3500.00 | Original 35840.00<br>5600.00 | 14950.00 |
| 10 | කුඩා කතුරු | 75.00 | 79.75 | 106.40 | 116.00 |
| 11 | ෆයිල් ටැග් | 2.50 | 6.00 | 1.96 | 2.75 |
| 12 | NPG 73 Canon Toner | --- | 40950.00 | Original 80640.00 | --- |
| 13 | 9*4 ලිපි කවර | 6.50 | 6.60 | 5.00 | --- |

(7 Days/ with Cheque) (21 Days) (වලංගු කාලය කිව නොහැක)

මිල ගණන් පරීක්ෂා කිරීමේදී එල්. එච්. චන්ද්‍රසේකර ආයතනයේ මිල ගණන් දින 07ක් පමණක් වලංගු සහ චෙක්පත සමග ඇණවුම දිය යුතු බව දන්වා තිබීමෙන් ද නිව් ජෙනරල් ආයතනයේ මිල ගනන් වලංගු දිනයක් නොමැති මෙන්ම මිල ගණන් අවම ඒවා නොවීමද හේතුවෙන් අවම මිල ගනන් දක්වා ඇති සෙන්ට්‍රල් ස්ටේෂනරිස් ආයතනයෙන් ටිපෙක්ස් 01ක් රු.60.00 ටත්, ජේපර් ක්ලිප්ස් සහ අඩිරූල් චන්ද්‍රසේකර ආයතනයේ අවම මිල වුවත් ඉහත කී කරුණු නිසා එම අයිතමය ද සෙන්ට්‍රල් ස්. ආයතනයෙන් ජේපර් ක්ලිප් එකක් රු.65.00 ට ත්, අඩි රූල් ද 01ක් 25.00ට ත්, ජේපර් කටර් 01ක් රු.30.00ට ත්, බොක්ස් ෆයිල් 3 01 ක් රු.475.00 ටත්, හයිලයිට් පෑන් 01ක් රු.75.00ටත්, හාඩ් ෆයිල් 01ක් රු.75.00 ටත්, කුඩා කතුරු 01 ක් රු.75.00ට ත්, සෙන්ට්‍රල් ස්ටේෂනරිස් වෙතින් මිලට ගැනමටත්, ජේපලර්යින් ආයතනයෙන් අවම මිලට පැන්සලක් රු.16.80ට ත්, 85A Hp Laserjet Toner Original එකක් රු.35840.00 ටත්, ෆයිල් ටැග් 01 ක් රු.1.96 ටත්, 9*4 ලිපි කවරයක් රු.5.00 ට ත්, මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි. මෙහිදී NPG 73 Canon Toner මිලෙන් ඉහළ අගයක් ගන්නා බැවින් නොයෙක් ආයතන මගින් නොව නියෝජිත ආයතනය මගින්ම සභා තීරණයක් හෝ ලබා ගත් පසු මිලට ගැනීම සුදුසු බවද ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 07**

ජල උපකරණ මිලට ගැනීමට අත්‍යාවශ්‍ය වූ බැවින් සහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ දේශීය නිශ්පාදිත ආයතනයක් වන නිසා ඇන්ටන් ආයතනයෙන් ද මිල ගණන් කැඳවූ අතර ඒ සඳහා ලද මිල ගණන් පහත පරිදි වේ.

| අනු අංः | විස්තරය | මහනුවර ඒජන්සිස් | ජයලංකා හාඩ්වෙයාර් | ANTON | උපුල් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 01 | 1"එල්බෝ | (S lon) 150.00 | (Anton) 135.00 | 98.25 | (S lon) 150.00 |
| 02 | ½" බෙන්ඩ් | 93.60 | 89.00 | 70.89 | 104.00 |
| 03 | 2" බෙන්ඩ් | 1310.00 | 1134.00 | 947.85 | 1310.00 |
| 04 | 1" බෙන්ඩ් | 225.00 | 190.00 | 163.54 | 225.00 |
| 05 | ½" ජල කරාම | 540.00 | (Browns) 360.00 | --- | 650.00 |
| 06 | අත් කියත් තල | 225.00 | (China)35.00 | --- | 250.00 |
| 07 | ½" වැල් සොකට් | 77.40 | (Anton) 69.00 | 52.19 | 86.00 |
| 08 | 25g PVC ගම් | 211.50 | (Arpico) 105.00 | 143.50 | 225.00 |
| 09 | 50 g PVC ගම් | 397.80 | (Anton)350.00 | 266.99 | 465.00 |
| 10 | ½" ත්‍රෙඩ් සීල් | 115.00 | 80.00 | 62.30 | 110.00 |
| 11 | 1"PVC ජලනල | 835.00 | 275.00 | 2367.40 | 1250.00 |
| 12 | ½"ගේට් වැල් | 391.50 | 340.00 | --- | 240.00 |
| 13 | 90 mm Repair Socket (With Rubberings) | 3600.00 | 2200.00 | 3337.49 | 1180.00 |
| 14 | 63 mm Repair Socket (With Rubberings) | 2000.00 | 480.00 | 1054.64 | 405.00 |

මිල ගණන් අනුව ජල උපකරණ අයිතම බහුතරයක් ඇන්ටන් සමාගමේ අවම මිලට පවතින බැවින්ද , එම සමාගම දේශීය නිශ්බාදිත ආයතනයක් වන බැවින් ද, 1"එල්බෝ 01ක් රු.98.25 ට ත්, ½" බෙන්ඩ් 01ක් රු.70.89 ට ත්, 2" බෙන්ඩ් 01ක් රු.947.85 ට ත්, 1" බෙන්ඩ් 01ක් රු.163.54 ට ත්, ½" වැල් සොකට් 01ක් රු. 52.19 ටත්, 50 g PVC ගම් 01ක් රු. 266.99 ටත්, ½" ත්‍රෙඩ් සීල් 01ක් රු. 62.30 ටත්, 1"PVC ජලනල 01ක් (4m) රු.2367.40 ටත්, 90 mm රෙපෙයාර් සොකට් (With Rubberings) 01ක් රු.3337.49 ට ත්, 63 mm රෙපෙයාර් සොකට් (With Rubberings) 01ක් රු.1054.64 ටත් ඇන්ටන් ආයතනයෙන් මිලට ගැනීමටත්, අයිතම කීපයක අවම මිල හා මිලට ගැනීමට පහසු ආසන්නව පිහිටි බැවින් ද, ½" ජල කරාමයක් රු. 360.00 ටත්, අත් කියත් තල 01ක් රු. 35.00 ටත්, 25g PVC ගම් 01ක් රු. 105.00 ටත්, ½"ගේට් වැල් 01ක් රු. 340.00 ටත්, ජයලංකා ආයතනයෙන් මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 08**

හයි ප්‍රෙෂර් සේදුම් යන්ත්‍ර සදහා මීට පෙර මිල කැදවා තිබූ නමුත් අදාල පිරිවිතර අනුව සරිලන සේදුම් යන්ත්‍ර නොතිබූ බැවින් යළි මිල ගණන් කැදවීය. පහත එම මිල ගණන් සදහන් වේ.

| අනු අං | විස්තරය | රීගල් හාඩ්වෙයාර් | මහනුවර ඒජන්සිස් | උපුල් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | කසළ කරත්ත සේදීම සදහා සාමාන්‍ය සේදුම් යන්ත්‍රයක් | 42500.00<br>110 Bar<br>( Olik/ 6 mnth) | 27500.00<br>(China) | 46500.00<br>100 Bar – ( Jiant/ 6 mnth) |
| 02 | ජල ටැංකි පිරිසිදු කිරීම සදහා අධි පීඩන සේදුම් යන්ත්‍රයක් | 42500.00<br>110 Bar<br>( Olik/6 mnth) | 27500.00<br>(China) | 119500.00<br>100 Bar – ( Clear/ 6 mnth) |
| | | (Order with Cheque) | (Order with Cheque) | (5Days Valid) |

මිල ගණන් අනුව කසළ කරත්ත සේදීම සදහා සාමාන්‍ය සේදුම් යන්ත්‍රයක් මිලට ගැනීම සුදුසු නමුත් මහනුවර ඒජන්සි හි අවම මිලට ඇති සේදුම් යන්ත්‍රයේ බාර් ප්‍රමාණය නොදැක්වීම හා එය Chin වගර්ය නිසාත්, චෙක්පත් ඇණවුම සමග ලබා දිය යුතුය යන කරුණු හේතුවෙන් ද, ජල ටැංකි පිරිසිදු කිරීමට අදාලව කුමන යන්ත්‍රය සාථර්කව ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂා කර බලා මිලදී ගැනීම වඩාත් සුදුසු ටෙන්ඩර් මණ්ඩල තීරණය යි. තවද, තවත් සැපයුම් ආයතනවලින් ද මිල ගණන් විමසා බලන මෙන් ද ඒ අනුව සුදුසුම සේදුම් යන්ත්‍ර 02ක් මිලට ගන්නා ලෙස ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 09**

හාලියද්ද පොදු සුසාන භූමියේ ඇති ගස් 03ක් (අනතුරුදායක වන බැවින්) අලෙවි කිරීම සදහා මිල ගණන් විමසීමට අවශ්‍ය අතර ප්‍රා.සභාවේ ගස්, ලී ආදිය මිලට ගන්නා ගැනුම්කරුවන් ලියාපදිංචි නොමැති බැවින් ද ප්‍රදේශයේ ප්‍රසිද්ධ ලී මෝල් හිමි ගැනුම්කරුවන්ගෙන් අළෙවි මිල ගණන් පිළිබදව දැනුම් දෙනු ලැබීය. ඒ සදහා ලද අළෙවි මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | විස්තරය | M.G. කරුණාරත්න නවදේවිට | A.G. සමන්ලතා යටිපියන්ගල | නිලන්ත කරුණාරත්න මිල්ලගහමුල |
|---|---|---|---|---|
| 01 | ගස් අංක 01 (මැදවට 2.18m/ උස 15m)<br>ගස් අංක 02 (මැදවට 1.88m/ උස 13m)<br>ගස් අංක 03 (මැදවට 1.34m/ උස 10m) | 15500.00<br>13000.00<br>4800.00 | 15000.00<br>12000.00<br>5200.00 | 35000.00 |

එම ප්‍රාදේශීය මිල ගණන් අනුව වැඩිම ඉල්ලුමට නිලන්ත කරුණාරත්න මහතා විසින් රු.35000.00ක මුදල සභාවේ ගිණුමට ගෙවීම් කර, අනතුරුව ගස් ඉවත් කර ගැනීම බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- **තීරණ අංක 10**

PV 3060 ටෙලර් රථය සදහා අවශ්‍ය අමතර කොටස් මිලට ගැනීමට මිල ගණන් කැදවීය.මිල ගණන් පහත පරිදි වේ.

| අනු අංකය | විස්තරය | එල් .එච්. චන්ද්‍රසෙකර | නිව් ජෙනරල් |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 01 | 750 * 16 වළලු රිම් | --- | 39000.00 |
| 02 | කොලර් | 900.00 | --- |
| 03 | ටියුබ් | 4300.00 | --- |

මෙම මිල ගණන් අනුව වළලු රිම් මිලෙන් වැඩි ය යන මතය ටෙන්ඩර් මණ්ඩලයෙන් ඉස්මතු වූ බැවින් ද, සසඳා බලා තීරණයක් ගැනීමට හෝ මිල ගණන් කිහිපයක් නොමැති නිසාද වෙළඳසැල්වලට ගොස් පරීක්ෂා කර බලා සාධාරණ මිලකට අයිතම 03ම ගැනීමේ අවස්ථාවක් තිබිය හැකි නිසා තවදුරටත් ප්‍රදෙශයේ සැපයුම් ආයතන වෙත ගොස් බලා අනතුරුව සුදුසු ආයතනයකින් ඉහත අයිතම මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 11**

කායර්ාලය සඳහා නිලධාරින් ගණනාවක් පත්වීම් ලබා පැමිණි අතර එම නිලධාරින් හට අත්‍යාවශ්‍ය සේවා සඳහා පැමිණීමට හෝ ඇදිරිනීති පැනවූ අවස්ථාවකදී හෝ නොයෙකුත් කාලීන හේතු මත කායර්ාලයට පැමිණීමට රාජකාරි හැඳුනුම්පතක් සකස් කර ගැනීමට අත්‍යාවශ්‍ය වී ඇත. එබැවින් රාජකාරි හැඳුනුම්පතක් සකස් කර ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති බැවින් ප්‍රදේහයේ ප්‍රසිද්ධ ආයතනවලින් මිල ගනන් කැඳවන ලදි.

| අනු අංකය | විස්තරය | |
|---|---|---|
| 01 | කරපටිය සහ ප්ලාස්ටික් ආවරණය සමග හැඳුණුම්පතක් සකස් කිරීම | **මිල ගණන් ලැබී නොතිබුණි.** |
| 02 | වෙබ් අඩවිය සඳහා ඡායාරූප ගැනීම<br>මෘදු හා මුද්‍රිත වශයෙන් එක් ඡායාරූපයක් සඳහා | |

මේ සඳහා මිල ගණන් කිසිවක් නොලැබුණ අතර මෙවැනි සේවා වත්මන් තත්වය මත සපයන්නේ අත්තිකාරම් මුදල් හෝ ලබා දුන් පසු විය හැකි බැවින් ප්‍රදේශයේ යම් මෙවැනි සේවා සපයන ආයතන හා සාකච්ඡා කොට අත් මිල ගනන් 03ක් හෝ ලබා ගෙන සුදුසු ආයතනයකින් මෙම සේවය ලබා ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- **තීරණ අංක 12**

CP LL 7586 අංක දරණ ෆෝටෝන් කෲ කැබ් රථය සඳහා ඉතා ඉක්මනින් තෙල් ටැංකියක් අවශ්‍ය වන අතර ඊට අදාලව මිල ගණන් කැඳවීය.

| අනු අංකය | විස්තරය | **AAR GARAGE** |
|---|---|---|
| 01 | CP LL 7586 ෆෝටෝන් කෲ කැබ් රථය සඳහා ඩීසල් ටැංකියක් | 28000.00 (රීකන්ඩිෂන්)<br>(6 MNTH WARR) |

මේ සදහා මිල ගණන් කැදවූ ආයතන අතුරින් MJR පීරිස් ආයතනයේ ටැංකි නැති බවට දුරකථන පණිවිඩයක් හා ඉන්ද්‍රා මෝටසර් මගින් අදාල ටැංකි නොමැති බවට Whatsup පණිවුඩයක්ද යොමු කොට තිබුණි. ලද එකම මිල ගනන් පරික්ෂා කළ අතර ඩීසල් ටැංකියක් ඉතා හදිසි නිසා ත්, රීකන්ඩිසන් වුවත් මෙයට මාස 06ක වගකීම් කාලයක් ද ඇති නිසා පවතින ඩීසල් ටැංකිය හා සමාන එකක් වන බැවින් ද රු.28000.00 ට **AAR GARAGE** ආයතනයෙන් අදාල ටැංකිය මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 13**

පුස්තකාල 06 සදහා වාෂීක පොත් මිලට ගැනීමට පෙර වසරවලදී මිල කැදවීම් කළ ද පළාත් පාලන කොමසාරිස්තුමාගේ ලිපියකින් දක්වා ඇති උපදෙස් අනුව ( 2021/10/22 දිනැති CPC/ACLG/K/AM05/10 ලිපිය ) 2022 වෂර්යට පොත් මිලදී ගැනීමේදී ප්‍රකාශන ආයතන කිහිපයකින් පොත්මිලට ගැනීම යෝග්‍ය බව පෙන්වා දී ඇත.එකම ආයතනයකින් පොත් මිලට නොගෙන ආයතන කිහිපයක් මේ සදහා තෝරා ගැනීම පිළිබදව ටෙන්ඩර් මණ්ඩලයට මෙම පුස්තකාලවල පොත් මිලදී ගැනීමේ කරුණ ඉදිරිපත් කරන ලදි.

**01- පුස්තකාල 06 සදහා 2022 වෂර්යට පොත් මිලදී ගැනීම එක් පුස්තකාලයකට රු.100000.00 (ලක්ෂයක) මුදලක් වෙන් වේ.**

මේ සම්බන්ධව ටෙන්ඩර් මණ්ඩලයේදී සිදු කළ සාකච්ඡාව අනුව ගුණාත්මක බවින් යුතු පොත් ලබා ගැනීම, වට්ටම් ලබා ගැනීම, දරුවන්ගේ අවශ්‍යතාවයට සරිලන පොත් ලබා ගැනීම ආයතන කිහිපයකින් පොත් ලබා ගත හැකි වීම යනාදී අවශයතා සම්පූණර් කරගත හැකි බැවින් ඉහත පුස්තකාල පොත් මිලට ගැනීම ආයතන කිහිපයකින් සිදු කර ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 14**

PB 7657 කැබ් රථයට බැටරියක් මිලදී ගැනීමට මිල කැදවන ලදි.මිල ගනන් කිසිවක් ඊට ලැබී නොතිබුණි.

| අනු අංකය | විස්තරය | මිල ගණන් ලැබී නොතිබුණි. |
|---|---|---|
| 01 | 90A 12V Excide | |

මේ සම්බන්ධවද ඉන්ද්‍රා ට්‍රෙඩසර් ආයතනයෙන් බැටරි නැති බවට Whatsup පණිවුඩයක්ද, MJR කැන්ඩි ට්‍රැක්ටර් මෝටසර් ආයතනවලින් දුරකථන පණිවුඩද මගින් (බැටරි නොමැති බවට) දැනුම් දෙන ලදි. මෙම හේතු නිසා මේ අයිතමයන් සැපයීම සම්බන්ධ ආයතන (ප්‍රාදේශීය) වේ නම් ඒවාගෙන් හෝ විමසා බලා හැකි ඉක්මනින් බැටරියක් මිලට ගෙන සවිකිරීම යෝග්‍ය බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. තවද Excide වගර්යම සෙවීමට වඩාත් අපහසු බැවින් හා ඒ සමාන වෙනත් බැටරි වගර්යක් ද යෙදීම කාලෝචිත බව ද ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 15**

දොළුව පුස්තකාලයේ පොත්වල බාකෝඩ් ස්ටිකර් ඇලවීම සදහා අවශ්‍ය ප්‍රින්ටරයේ ටෝනර් සහ ස්ටිකර් රෝල් මිලට ගැනීමට මිල කැදවීය. ඒ සදහා මිල ගණන් 02ක් Whatsup පණිවුඩ හරහා එවා තිබුයේ තැපැල් කිරීමට තරම් ප්‍රමානවත් කාලයක් නොමැති වීම හේතුවෙනි. තවද, එල්.එච්. චන්ද්‍රසේකර, නිව් ජෙනරල් ආදී ආයතනවල මෙම රිබන් (ටෝනර්) වගර්ය නොමැති බවට ද Whatsup පණිවුඩ එවා තිබුණි.

| අනු අංකය | විස්තරය | පේපලර්යින් | ඔෆිස් ෂොප් |
|---|---|---|---|
| 01 | Ribbon ( ZEBRA ZD 230 T) | 2550.00 | 3750.00 (ZD 230 T) |
| 02 | Sticker Roll | --- | 5500.00 |

මෙම මිල ගණන් අනුව පේපලර්යින් ආයතනයෙන් ටෝනරය අවම මිල වුවත් ඔෆිස් ෂොප් ආයතනයෙන් පිරිවිතර අනුකූලවම (ZD 230 T) ටෝනර් රිබන් ලබා දෙන බැවින් ද, ටෝනර් එක් ආයතනයකින් හා ස්ටිකර් තවත් ආයතනයකින් මිලට ගත් පසු ඒ දෙකෙහි නොගැලපීමක් වූවොත් නැවත අපහසුතාවයට පත්වීමට හැකි බැවින් ද අයිතම දෙකම ඔෆිස් ෂොප් ආයතනයෙන් එනම්, ZEBRA Ribbon එකක් රු.3750.00 ටත්, ස්ටිකර් රෝල් 01ක් රු. 5500.00 ටත් මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 16**

ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ආහාරපාන මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඒ අනුව පෙරදී කටයුතු කළද මහ සභාව සඳහා අවශ්‍ය ආහාරපාන මිලට ගැනීමේදී විශාල මුදලක් වැය වන බැවින් ඒ සම්බන්ධව කරුණු සාකච්ඡා කෙරුණි.

01- සභාව සඳහා අවශ්‍ය ආහාරපාන මිලට ගැනීම

මේ සම්බන්ධව ටෙන්ඩර් මණ්ඩලයේදී සිදු කළ සාකච්ඡාව අනුව දැනට මහ සභාව සඳහා ලබා දෙන දිවා ආහාරය නැවැත්වීමට පෙරසභාවේදීම තීරණය කොට තිබූ බවත් , මේ වන තෙක් සීතා රෙස්ටුරන්ට් ආයතනයෙන් ආහාර මිලට ගත් අතර අයිතම ගනනාවක් ඔවුන්ට ලබා දීමට නොහැකි බවට ද කරුණු දැක්වුණි.

උදා- පේපර් ප්ලේට්/ සේවියට්, රයිස් ඇන්ඩ් කරි, සැන්විචස්, කෙසෙල්, සීනි, තේ කුඩු ආදිය...

මේ හේතුවෙන් හදිසි සංග්‍රහ කටයුතු සිදු කිරීමේදී ආයතන හා වෙළඳසැල් කිහිපයකින් මිලට ගැනීම් සිදු වුවහොත් කාලය මෙන්ම අපහසුතා මතුවන බවට පැහැදිලි කෙරුණි. එබැවින් අවසන් වශයෙන් සභාව සඳහා අවශ්‍ය ආහාර පාන මිලට ගැනීමේදී අයිතම හැකිනම් සියල්ලම එක් ආයතනයකින් ලබා ගත හැකි සහ රු.5000.00 සීමාවට වැඩි වන අවස්ථාවන්වලදී ප්‍රාදේශීය මිල ගනන් 03ක් වත් ලබා ගෙන ඒ අනුව සරිලන සැපයුම්කරුවකුගෙන් මෙම සංග්‍රහ ද්‍රව්‍ය මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

<u>ටෙන්ඩර් මණ්ඩලය</u>

01. ඩී.ජී. ගුණසේන මයා - ගරු සභාපති
02. අසේල අමරසේන මයා - ගරු උප සභාපති
03. ජයන්ත කීතරීසිංහ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ශාන්ත නවරත්න මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ඒ.එච්.ඒ.රත්නායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. හේමකුමාර නයනානන්ද මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. මංජුල දිසානායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. රන්ජන් රාජපක්ෂ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. තංගවේලු කාමරාජන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩිමෝෂි වෙලපලාගම මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි

11. කෝකිලා  වරාහේන මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි

එස්.සුබසිංහ  මිය - ලේකම්
ඩබ්.එන්.පොඩිමැණිකේ මිය - සංවධර්න නිලධාරි

සකස් කළේ: ...……………......…………

පරීක්ෂා කළේ: ………………………….....

සභාපති / ලේකම්: ……………..................…